
# නිෂ්පාදන හැකියා මායිම් වක්‍ර

❑ නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය

යම් දෙන ලද අවස්ථාවක ආර්ථිකය සතු සියලුම සම්පත් පවත්නා තාක්ෂණ මට්ටමක් යටතේ උපරිම කාර්යක්ෂමතාවකින් යුක්තව උපයෝජනය කොට කිසියම් භාණ්ඩ දෙවර්ගයකින් නිපදවිය හැකි නිෂ්පාදන සංයෝග යා කොට අඳිනු ලබන රේඛාව නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයයි.




©JMC vLearning

# නිෂ්පාදන හැකියා මායිම් වක්‍ර

- නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් ඇඳීමේදී පදනම් කර ගනු ලබන උපකල්පන

- භාණ්ඩ දෙවර්ගයක් පමණක් නිෂ්පාදනය කිරීම
- සම්පත් සම්භාරය ස්ථාවරව පැවතීම
- තාක්ෂණය නොවෙනස්ව පැවතීම
- සම්පත් පූර්ණ හා උපරිම කාර්යක්ෂමතාවයෙන් යුතුව භාවිතා කිරීම

(පූර්ණ නිෂ්පාදනය හා පූර්ණ සේවා නියුක්තිය)

JMC vLearning "your virtual learning partner"

©JMC vLearning

# නිෂ්පාදන හැකියා මායිම් වක්‍ර

❑ පහත දත්ත මත පදනම්ව නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් ගොඩනගන්න.

| සහල් (මෙට්‍රික් ටොන්) | රෙදි පිළි (යාර දහස්) |
|---|---|
| 0 | 20 |
| 10 | 15 |
| 20 | 10 |
| 30 | 5 |
| 40 | 0 |

JMC vLearning "your virtual learning partner"

©JMC vLearning

# නිෂ්පාදන හැකියා මායිම් වක්‍ර

- නිෂ්පාදන හැකියා මායිම් වක්‍ර වල ආර්ථික සංකල්ප නිරූපනය කිරීම.

- සම්පත් හිඟකම
- විකල්ප ප්‍රයෝජන හා තේරීම
- නිෂ්පාදන කාර්යක්ෂමතාවය
- නිෂ්පාදන අකාර්යක්ෂමතාවය
- පූර්ණ සේවා නියුක්තිය
- ඌන සේවා නියුක්තිය හෙවත් සේවා වියුක්තිය
- ආර්ථික වර්ධනය
- ආර්ථික පසුබැසීම/ ප්‍රතිගමනය
- ආර්ථික අවපාතය/ පරිහානිය
- නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය වමට හා දකුණට විතැන් වීම
- ආවස්ථික පිරිවැය (ස්ථාවර, වැඩෙන හා හීන වන)

JMC vLearning
"your virtual learning partner"

# නිෂ්පාදන හැකියා මායිම් වක්‍ර

- නිෂ්පාදන හැකියා මායිම් වක්‍ර වල ආර්ථික සංකල්ප නිරූපනය කිරීම.

| | |
|---|---|
| හිඟකම | නිෂ්පාදන හැකියා මායිමට පිටතින් පිහිටි ඕනෑම භාණ්ඩ සංයෝගයක් දැක්වෙන ලක්ෂයක් හිඟකම නිරූපනය කරයි. |
| විකල්ප ප්‍රයෝජන හා තේරීම | නිෂ්පාදන හැකියා මායිම මත ඕනෑම ලක්ෂයක් හරහා විකල්ප ප්‍රයෝජන පෙන්නුම් කළ හැක. නමුත් එම ලක්ෂ අතුරින් එක් ලක්ෂයක් පමණක් තෝරාගැනීමට ආර්ථිකයකට සිදුවේ. එය තේරීම වශයෙන් හැඳින්වේ. |
| නිෂ්පාදන කාර්යක්ෂමතාව | නිෂ්පාදන හැකියා මායිම මත ඕනෑම ලක්ෂයකින් නිෂ්පාදනයේ කාර්යක්ෂමතාව පෙන්නුම් කළ හැක.<br><br>මෙහිදී ආර්ථිකය විසින් පූර්ණ සේවා නියුක්තිය හා පූර්ණ නිෂ්පාදනය අත්කරගෙන ඇත. |

JMC vLearning "your virtual learning partner"

# නිෂ්පාදන හැකියා මායිම් වක්‍ර

| | |
|---|---|
| නිෂ්පාදන අකාර්යක්ෂමතාව | නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයට ඇතුලතින් පිහිටි ලක්ෂයකින් නිෂ්පාදනයේ අකාර්යක්ෂමතාව පෙන්නුම් කළ හැක. |
| පූර්ණ සේවා නියුක්තිය | ආර්ථිකය සතු සියලුම නිෂ්පාදන සම්පත් පූර්ණ වශයෙන් නිෂ්පාදනයට භාවිතා කොට තිබීම මින් අදහස් වේ.<br><br>නිෂ්පාදන හැකියා මායිම මත ලක්ෂයකින් පූර්ණ සේවා නියුක්තිය පෙන්නුම් කළ හැක. |
| ඌන සේවා නියුක්තිය | ආර්ථිකය සතු සියලුම නිෂ්පාදන සම්පත් පූර්ණ වශයෙන් නිෂ්පාදනයට භාවිතා කොට නොතිබීම මින් අදහස් වේ.<br><br>නිෂ්පාදන හැකියා මායිමට ඇතුළතින් පිහිටි ලක්ෂයකින් ඌන සේවා නියුක්තිය පෙන්නුම් කළ හැක. |

JMC vLearning
"your virtual learning partner"
©JMC vLearning

# නිෂ්පාදන හැකියා මායිම් වක්‍ර

| | |
|---|---|
| ආර්ථික වර්ධනය | ආර්ථිකයක නිෂ්පාදන හැකියාවේ අඛණ්ඩ වැඩි වීමයි. මෙහිදී නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය කාලයත් සමඟ අඛණ්ඩව දකුණට විතැන් වේ. |
| ආර්ථික පසු බැසීම | ආර්ථිකයක නිමැවුම වර්ෂයකට වඩා අඩු එනම් මාස කිහිපයක පමණ කාලයක් තිස්සේ පහළ වැටෙමින් පවත්නා තත්වයකි.<br><br>නිෂ්පාදන හැකියා මායිම මත භාණ්ඩ සංයෝගයක් වක්‍රය ඇතුළත ලක්ෂයකට මාරු වීම හරහා එය නිරූපනය කළ හැක. |
| ආර්ථික පරිහානිය | ආර්ථික පසුබැසීමේ උච්චතම අවස්ථාවයි. මෙහිදී ආර්ථිකයේ ප්‍රාග්ධන තොගයට හානි සිදුවිය හැකි බැවින් නිෂ්පාදන හැකියාව අඩුවී නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය වමට විතැන් වේ. |

©JMC vLearning

# නිෂ්පාදන හැකියා මායිම් වක්‍ර

| | |
|---|---|
| නිශ්පාදන හැකියා මායිම වමට විතැන් වීම | 1. සම්පත් සම්භාරය අඩු වීම<br>2. සාධක ඵලදායිතාවය පහළ යාම<br>3. තාක්ෂණය පිරිහීම<br><br>(වමට විතැන් වීමට බලපානු ලබන හේතු) |
| නිශ්පාදන හැකියා මායිම දකුණට විතැන් වීම | 1. සම්පත් සම්භාරය වැඩි වීම<br>2. සාධක ඵලදායිතාවය ඉහළ යාම<br>3. තාක්ෂණය දියුණු වීම<br><br>(දකුණට විතැන් වීමට බලපානු ලබන හේතු) |

JMC vLearning "your virtual learning partner"

©JMC vLearning

# නිෂ්පාදන හැකියා මායිම් වක්‍ර

| | |
|---|---|
| ස්ථාවර ආවස්ථික පිරිවැය | නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය මත එක් භාණ්ඩයක නිෂ්පාදනය සමාන ඒකක වලින් වැඩි කිරීමේදී අනෙක් භාණ්ඩයෙන් කැපකරන ප්‍රමාණය ස්ථාවර අගයක් ගනී.<br>වක්‍රය සරල රේඛීයව පහතට බෑවුම් වේ. |
| වැඩෙන ආවස්ථික පිරිවැය | නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය මත එක් භාණ්ඩයක නිෂ්පාදනය සමාන ඒකක වලින් වැඩි කිරීමේදී අනෙක් භාණ්ඩයෙන් කැපකරන ප්‍රමාණය ක්‍රමයෙන් ඉහළ යයි.<br>වක්‍රය මූලයට අවතල හැඩයක් ගනී |
| හීන වන ආවස්ථික පිරිවැය | නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය මත එක් භාණ්ඩයක නිෂ්පාදනය සමාන ඒකක වලින් වැඩි කිරීමේදී අනෙක් භාණ්ඩයෙන් කැපකරන ප්‍රමාණය ක්‍රමයෙන් පහළ යයි.<br>වක්‍රය මූලයට උත්තල හැඩයක් ගනී |

JMC vLearning "your virtual learning partner"

# පසුගිය විභාග ප්‍රශ්න

(a) එකිනෙකට උදාහරණයක් සමඟ ආර්ථික භාණ්ඩ, ආර්ථික නොවන භාණ්ඩවලින් **වෙනස්කොට දක්වන්න**.

(ලකුණු 03)

(c) ආර්ථික විද්‍යාවේ එන ආවස්ථික පිරිවැය යන සංකල්පය උදාහරණයක් සමඟ **පැහැදිලි කරන්න**. (ලකුණු 03)

**1.4** පහත සඳහන් ඒවා අතුරෙන්, නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයේ උපකල්පනයක් වන්නේ කුමක් ද?

(1) තාක්ෂණය ස්ථාවර නොවේ.

(2) භාණ්ඩ දෙකක් පමණක් නිෂ්පාදනය කරයි.

(3) සියලුම පවතින සම්පත් ස්ථාවර නොවේ.

(4) සම්පත් පූර්ණ වශයෙන් උපයෝජනය නොකෙරේ.

JMC vLearning
"your virtual learning partner"
©JMC vLearning

# පසුගිය විභාග ප්‍රශ්න

1.1 පහත සඳහන් ඒවා අතුරෙන්, ආර්ථික භාණ්ඩයක ලක්ෂණයක් වන්නේ කුමක් ද?

(1) ආර්ථික භාණ්ඩයක් නිපදවීමේදී ආවස්ථික පිරිවැයක් නොමැත.

(2) ආර්ථික භාණ්ඩයක් යනු නිෂ්පාදන ක්‍රියාවලියක ප්‍රතිඵලයකි.

(3) සැපයුමේ හිඟකමක් නොමැත.

(4) ආර්ථික භාණ්ඩයක්, ස්වභාවදහමේ දායාදයක් ලෙස සළකනු ලැබේ.

(c) (i) ආර්ථික විද්‍යාවේ "තේරීම" (choice) යන්නෙන් අදහස් කරන්නේ කුමක්දැයි **පැහැදිලි කරන්න**. (ලකුණු 02)

(ii) නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක උපකල්පන (assumptions) දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 02)

©JMC vLearning

# පසුගිය විභාග ප්‍රශ්න

(a) ආර්ථික නොවන භාණ්ඩවල ලක්ෂණ තුනක්(03) **සඳහන් කරන්න.** (ලකුණු 03)

(a) ආර්ථික භාණ්ඩ (Economic Goods) සහ ආර්ථික නොවන භාණ්ඩ (Non-Economic Goods) අතර වෙනස එකිනෙකට උදාහරණයක් බැගින් දෙමින් **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

JMC vLearning "your virtual learning partner"

©JMC vLearning

# මූලික ආර්ථික ප්‍රශ්න

- කුමක්, කොපමණ නිෂ්පාදනය කරන්නේ ද?
- කෙසේ නිෂ්පාදනය කරන්නේ ද?
- කා සඳහා නිෂ්පාදනය කරන්නේ ද?

©JMC vLearning

# මූලික ආර්ථික ප්‍රශ්න

- කුමක්, කොපමණ නිෂ්පාදනය කරන්නේ ද?

- ආර්ථිකය සතු සම්පත් හිඟ බැවින් සමාජයට අවශ්‍ය සියලු භාණ්ඩ නිපදවා ගත නොහැකි බැවින් කුමන භාණ්ඩ කොපමණ ප්‍රමාණයෙන් නිපදවා ගත යුතුද යන්න තීරණය කිරීම මෙහිදී සිදුවේ.

මෙය සම්පත් බෙදා වෙන්කිරීමේ ගැටලුව ලෙසද හඳුන්වයි.

©JMC vLearning

# මූලික ආර්ථික ප්‍රශ්න

- කෙසේ නිෂ්පාදනය කරන්නේ ද?

- භාණ්ඩ හා සේවා නිෂ්පාදනය සඳහා හිඟ සම්පත් කවර අනුපාතයකට මිශ්‍ර කළ යුතුද? නැතහොත් කවර තාක්ෂණයක් හා ශිල්ප ක්‍රමයක් භාවිතා කළ යුතුද? යන්න තීරණය කිරීම මෙහිදී සිදුවේ

- මෙය නිෂ්පාදන ශිල්ප ක්‍රමය පිලිබඳ ගැටලුව ලෙසද හඳුන්වයි.

©JMC vLearning

# මූලික ආර්ථික ප්‍රශ්න

කා සඳහා නිෂ්පාදනය කරන්නේ ද?

හිඟ සම්පත් භාවිතා කරමින් නිපදවන ලද භාණ්ඩ හා සේවා තොගය සමාජයේ කා අතර බෙදා හරීද යන්න මෙම ගැටලුවෙන් අදහස් වේ.

- කුටුම්බ වල ක්‍රය ශක්තිය මත එම නිෂ්පාදනය බෙදී යාම තීරණය වේ.
- මෙය ආදායම් ව්‍යාප්තිය පිලිබඳ ගැටලුව ලෙසද හඳුන්වයි.

©JMC vLearning

# මූලික ආර්ථික ප්‍රශ්න

- ආර්ථික පද්ධතියක් යනු?

- ඕනෑම ආර්ථිකයක් විසින් මුහුණ දෙන මූලික ආර්ථික ප්‍රශ්න විසඳා ගැනීම සඳහා සමාජයක් තුළ ජීවත් වන මිනිසුන් විසින් නිර්මාණය කර ඇති යාන්ත්‍රණයක් හෙවත් ආර්ථික වැඩපිළිවෙලක් ආර්ථික පද්ධතියක් ලෙස අදහස් කෙරේ.




©JMC vLearning

# ආර්ථික පද්ධතියක දක්නට ඇති මූලිකාංග




©JMC vLearning

# ආර්ථික පද්ධති වර්ග කිරීමේ පදනම්

- සම්පත් අයිතිය/ දේපළ හිමිකම
- මූලික ආර්ථික ප්‍රශ්න විසඳීමේ යාන්ත්‍රණය
- සානුබල පද්ධතිය

©JMC vLearning


# ප්‍රධාන ආර්ථික පද්ධති

- වෙළඳපොළ ආර්ථික පද්ධති
- විධානගත/ සැලසුම්ගත ආර්ථික පද්ධති
- මිශ්‍ර ආර්ථික පද්ධති

©JMC vLearning

# වෙළඳපොළ ආර්ථික පද්ධති

වෙළඳපොළ ඉල්ලුම් හා සැපයුම් බලවේග වලට අනුව තීරණය වන මිල යාන්ත්‍රණය මත මූලික ආර්ථික ප්‍රශ්න විසඳා ගන්නා ආර්ථික පද්ධතියක් වෙළඳපොළ ආර්ථිකයක් ලෙස හැඳින්වේ.




©JMC vLearning

# වෙළඳපොළ ආර්ථික පද්ධති

## වෙළඳපොළ ආර්ථිකයක මූලික ලක්ෂණ

- මිල යාන්ත්‍රණය මත පදනම්ව මූලික ආර්ථික ප්‍රශ්න විසඳීම
- දේපල හිමිකාරීත්වය පෞද්ගලික අංශය සතු වීම
- පෞද්ගලික ව්‍යවසාය ක්‍රමයක් ක්‍රියාත්මක වීම
- රජයේ කාර්යභාරය සීමිත වීම
- පාරිභෝගික ස්වාධිපත්‍යයක් පැවතීම
- වෙළඳපොළ තුළ තරඟකාරීත්වය පැවතීම
- තේරීමේ නිදහස පැවතීම

©JMC vLearning

# වෙළඳපොළ ආර්ථික පද්ධති

## වෙළඳපොළ ආර්ථිකයක මිලෙහි ප්‍රධාන කාර්යයන්

- සංඥා සැපයීමේ කාර්යය
- සානුබල සැපයීමේ කාර්යය
- සලාකනය කිරීමේ කාර්යය

©JMC vLearning

# වෙළඳපොළ ආර්ථික පද්ධති

## සංඥා සැපයීමේ කාර්යය

- \- නිෂ්පාදකයන්ට නිෂ්පාදන තීරණ ගැනීම සඳහා
- (කුමන භාණ්ඩ කොතරම් ප්‍රමාණයෙන් නිපදවන්නේද ? අලෙවි කළ යුතු මිල කොපමණද? යන්න තිරණය කිරීමට)
- \- පාරිභෝගිකයන්ට පරිභෝජන තීරණ ගැනීම සඳහා
- (කුමන භාණ්ඩ කොතරම් මිලට ගන්නේද? ඒ සඳහා ගෙවන මිල කොපමණද? යන්න තිරණය කිරීමට)

©JMC vLearning

# වෙළඳපොළ ආර්ථික පද්ධති

නිෂ්පාදන සාධක බල සැපයීම

භාණ්ඩයක මිල ඉහළ ගිය විට

ඉපයිය හැකි ලාභය වැඩිවේ

නිෂ්පාදනය වැඩි කිරීමට පෙළඹේ

©JMC vLearning

# වෙළඳපොළ ආර්ථික පද්ධති

පාරිභෝගික සානු බල සැපයීම

භාණ්ඩයක මිල ඉහළ ගිය විට

පරිභෝජන වියදම වැඩිවේ

පරිභෝජනය සීමා කිරීමට පෙළඹේ

©JMC vLearning

# වෙළඳපොළ ආර්ථික පද්ධති

## සලාක කිරීමේ කාර්යය

- - හිඟ සම්පත් විකල්ප භාවිත අතර බෙදා වෙනකොට දීම හෙවත් සලාක කොට දීම මින් අදහස් වේ.
- උදා -
- කිසියම් භාණ්ඩයක මිල වැඩි වන විට එම කර්මාන්තයේ සාපේක්ෂ ලාභය වැඩි වන අතර සාපේක්ෂ ලාභ අඩු කර්මාන්ත වල සිට එම කර්මාන්තය දක්වා සම්පත් සංචලනය වීම සිදුවේ.

©JMC vLearning

# වෙළඳපොළ ආර්ථික පද්ධති

## වෙළඳපොළ ආර්ථිකයක යහපත් ලක්ෂණ

- ආර්ථික නිදහස
- තේරීමේ නිදහස
- පාරිභෝගික ස්වාධිපත්‍ය
- නව්‍යතා බිහිවීම හා දිරිමත් වීම
- තරඟකාරීත්වය නිසා නිෂ්පාදන කටයුතු කාර්යක්ෂම වීම
- විමධ්‍යගත ක්‍රියාවලිය හරහා තීරණ ගැනීම පහසු වීම

©JMC vLearning

# වෙළඳපොළ ආර්ථික පද්ධති

## *<u>වෙළඳපොළ ආර්ථිකයක අයහපත් ලක්ෂණ</u>*

- ආර්ථික අස්ථායීතා හට ගැනීම
- ආදායම් ව්‍යාප්තියේ විෂමතා හට ගැනීම
- පොදු භාණ්ඩ නොසැපයීම
- ශුභසාධන භාණ්ඩ ප්‍රමාණවත්ව නිෂ්පාදනය නොවීම
- අවගුණ භාණ්ඩ අධි නිෂ්පාදනය
- ලාබදායී අංශ වලට පමණක් සාධක සේවා නියුක්ත කිරීම

©JMC vLearning

# වෙළඳපොළ ආර්ථික පද්ධති


## වෙළඳපොළ ආර්ථිකයක් මූලික ආර්ථික ප්‍රශ්න විසඳීම

| කුමක් කොපමණ නිපදවන්නේ ද? | කෙසේ නිපදවන්නේ ද? | කා සඳහා නිපදවන්නේ ද? |
|---|---|---|
| වැඩි ලාභයක් ලැබිය හැකි භාණ්ඩ හා සේවා නිපදවීම සඳහා වැඩි සම්පත් ප්‍රමාණයක් යොමුකරයි | අවම පිරිවැයක් සහිත වැඩි ලාභයක් ඉපයිය හැකි ශිල්ප ක්‍රමය භාවිතා කරයි | ක්‍රය ශක්තියක් සහිත පාරිභෝගිකයන්ට මිලට ගත හැකි වන පරිදි භාණ්ඩ නිපදවයි. |

©JMC vLearning

# විධානගත ආර්ථික පද්ධති

මධ්‍යගත සැලසුම් අධිකාරිය විසින් දෙනු ලබන නියෝග මත පදනම්ව මූලික ආර්ථික ප්‍රශ්න විසඳා ගන්නා ආර්ථික පද්ධතියක් විධානගත ආර්ථික පද්ධතියක් ලෙස අදහස් කෙරේ.



©JMC vLearning

# විධානගත ආර්ථික පද්ධති

## විධානගත ආර්ථිකයක මූලික ලක්ෂණ

- සැලසුම් යාන්ත්‍රණය මත පදනම්ව මූලික ආර්ථික ප්‍රශ්න විසඳීම
- දේපල හිමිකාරීත්වය රජය අංශය සතු වීම
- රාජ්‍ය ව්‍යවසාය ක්‍රමයක් ක්‍රියාත්මක වීම
- සමාජ සුභසාධනය පිණිස කටයුතු කිරීම
- පාරිභෝගික ස්වාධිපත්‍යයක් නොමැති වීම
- සාධාරණ ආදායම් ව්‍යාප්තියක් පැවතීම
- තේරීමේ නිදහස නොපැවතීම

©JMC vLearning

# විධානගත ආර්ථික පද්ධති

## විධානගත ආර්ථිකයක යහපත් ලක්ෂණ

- ආදායම් ව්‍යාප්ති විෂමතා අවම වීම
- ආර්ථික අස්ථායීතා පාලනය කළ හැකි වීම
- මනා සැලැස්මක් මත ක්‍රමානුකූලව සම්පත් බෙදා හරිය හැකි වීම
- සමාජයට අත්‍යාවශ්‍ය පොදු භාණ්ඩ හා සේවා සැපයීම
- සමාජයේ ජීවත් වන පුද්ගලයන්ට අවම ජීවන මට්ටමක් සහතික කිරීම

©JMC vLearning

# විධානගත ආර්ථික පද්ධති

## විධානගත ආර්ථිකයක අයහපත් ලක්ෂණ

- රාජ්‍ය ඒකාධිකාරය
- නිළධාරීවාදය
- ආර්ථික නිදහසක් නොමැති වීම
- පාරිභෝගික ස්වාධිපත්‍ය බිඳවැටීම
- තේරීමේ නිදහස සීමා වීම
- මහන්සි වී වැඩ කිරීමට සානුබල නොමැති වීම
- ආර්ථික වර්ධනය මන්දගාමී වීම

©JMC vLearning

# විධානගත ආර්ථික පද්ධති

## විධානගත ආර්ථිකයක් මූලික ආර්ථික ප්‍රශ්න විසඳීම

| කුමක් කොපමණ නිපදවන්නේ ද? | කෙසේ නිපදවන්නේ ද? | කා සඳහා නිපදවන්නේ ද? |
|---|---|---|
| සමාජයේ අවශ්‍යතාවය මත පදනම්ව කුමන භාණ්ඩ කොපමණ නිපදවන්නේ ද යන්න මධ්‍යගත සැලසුම් අධිකාරිය තීරණය කරයි | සමාජයේ අවශ්‍යතාවය මත රටේ සම්පත් පූර්ණ ලෙස උපයෝජනය වන ආකාරයට භාණ්ඩ නිෂ්පාදනයට හිඟ සම්පත් යොමු කරයි | සමාජයේ අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් මධ්‍යගත සැලසුම් අධිකාරිය මෙම ප්‍රශ්නයට විසඳුම් ලබා දේ. පුද්ගල ආදායම මත නිෂ්පාදිතය බෙදී යන අතර එය වැටුප මත තීරණය වේ |

©JMC vLearning

# මිශ්‍ර ආර්ථික පද්ධති

මූලික ආර්ථික ප්‍රශ්න විසඳා ගැනීමට මිල යාන්ත්‍රණය මෙන්ම සැලසුම් යාන්ත්‍රණය ද ක්‍රියාත්මක වන ආර්ථික ක්‍රමයක් මින් අදහස් වේ.




©JMC vLearning

# මිශ්‍ර ආර්ථික පද්ධති

## මිශ්‍ර ආර්ථිකයක මූලික ලක්ෂණ

- මූලික ආර්ථික ප්‍රශ්න විසඳීම සඳහා මිල යාන්ත්‍රණය මෙන්ම සැලසුම් යාන්ත්‍රණය ක්‍රියාත්මක වීම.
- දේපල හිමිකාරීත්වය පෞද්ගලික අංශය මෙන්ම රාජ්‍ය අංශය සතු වීම
- සේවා නියුක්තියට පෞද්ගලික අංශය මෙන්ම රාජ්‍ය අංශයේ දායකත්වය සැපයීම
- පෞද්ගලික අංශය ස්වාර්ථය මත අභිප්‍රේරණය වන අතර පොදු අංශය පොදු යහපත මත අභිප්‍රේරණය වීම.

©JMC vLearning

# මිශ්‍ර ආර්ථික පද්ධති

## මිශ්‍ර ආර්ථිකයක් මූලික ආර්ථික ප්‍රශ්න විසඳීම

| කුමක් කොපමණ නිපදවන්නේ ද? | කෙසේ නිපදවන්නේ ද? | කා සඳහා නිපදවන්නේ ද? |
|---|---|---|
| ලාභ ලැබියහැකි භාණ්ඩ නිෂ්පාදනය සඳහා පෞද්ගලික අංශය පෙළඹෙන අතර රජය සමාජ ශුබසාධන පරමාර්ථයෙන් භාණ්ඩ නිපදවයි | පෞද්ගලික අංශය අවම පිරිවැයක් සහිත ශිල්ප ක්‍රමය තෝරා ගන්නා අතර රජය සමාජ සාධාරණත්වය පදනම් වන සේ ශිල්ප ක්‍රමය තෝරාගනී | පෞද්ගලික අංශය ක්‍රයශක්තියක් සහිත පාරිභෝගිකයන් සඳහා භාණ්ඩ නිපදවන අතර රජය මැදිහත් වී එම ක්‍රයශක්තිය කෙරෙහි බලපෑම් ඇති කරයි |

©JMC vLearning

# මිශ්‍ර ආර්ථික පද්ධති

## මිශ්‍ර ආර්ථිකයක ආණ්ඩුවේ කාර්යභාරය

- ව්‍යාපාර සඳහා බදු සහනාධාර හඳුන්වා දීම
- ඒකාධිකාරය වළක්වා තරඟය පවත්වාගෙන යාම
- ආදායම් ව්‍යාප්ති විෂමතා අවම කිරීම
- සේවක හා පාරිභෝගික අයිතීන් සුරක්ෂිත කිරීම
- යටිතල පහසුකම් දියුණු කිරීම
- පොදු භාණ්ඩ හා සුභසාධන භාණ්ඩ ප්‍රමාණවත් පරිදි සැපයීම
- පරිසරය ආරක්ෂා කිරීම
- ආර්ථික අස්ථායිතා අවම කිරීම

©JMC vLearning

# ව්‍යාපාර පරිසරය තුළ ආර්ථික විද්‍යාවේ භූමිකාව

## ආර්ථික විද්‍යාවේ සංකල්ප භාවිතා කරමින් ගනු ලබන තීරණ

උදා -

- නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩයේ මිල තීරණය කිරීමට
- කිසියම් භාණ්ඩයක් නිෂ්පාදනය කළ යුතු ප්‍රමාණය තීරණය කිරීමට
- ප්‍රචාරණය සිදු කරන්නේ නම් ඒ සඳහා යොදා ගන්නා මාධ්‍ය තීරණය කිරීමට
- වඩාත් ලාභදායී නිෂ්පාදන ශිල්ප ක්‍රමය තෝරා ගැනීමට
- කිසියම් භාණ්ඩයක් තම ආයතනය තුළ නිෂ්පාදනය කළ යුතුද නැත්නම් වෙනත් ආයතනකින් මිලට ගත යුතුද යන්න තීරණය කිරීමට
- අවශ්‍ය අරමුදල් සම්පාදනය කරගැනීම හා අතිරික්ත අරමුදල් ආයෝජනය කිරීමට

©JMC vLearning